## තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය

# පුරප්පාඩු

මෙම ආයතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. ශිල්ප ප්‍රදර්ශක II ශ්‍රේණිය - Craft Demonstrator Grade II (Foundry Work and Sheet Metal Work)

**අවශ්‍ය සුදුසුකම්:**

1. පහත සඳහන් ක්ෂේත්‍ර එකක් හෝ කිහිපයක පළපුරුද්ද සමග අදාළ ක්ෂේත්‍රයේ (Foundry Work and Sheet Metal Work) පළපුරුද්ද ලබා තිබීම,
   (Foundry Practice, Welding & Smithy, Machine Tools, Pattern Making, Sheet Metal Work, Carpentry and Metal Work)

සහ

2. විශ්වවිද්‍යාල/රජයේ සේවයේ හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පුහුණු ශිල්පියෙකු ලෙස අවම වශයෙන් වසර (15) පළපුරුද්දක් ලබා තිබීම හෝ,

3. විශ්වවිද්‍යාල/රජයේ සේවයේ හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පුහුණු විශේෂ ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර (03) පළපුරුද්දක් ලබා තිබීම.

බඳවා ගනු ලබන ආකාරය : ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි
වැටුප් පරිමාණය : රු. 49,475 – 17x540– 58,655 (U- MN 1(III)]මාසික

### 02. පරිපාලක සිවිල් (III ශ්‍රේණිය) - Supervisor (Civil) Grade III

**අවශ්‍ය සුදුසුකම්:**

1. (අ) ජාතික තාක්ෂණ සහතිකය (NCT) හෝ සමාන සුදුසුකම් සමග අවුරුදු (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

(ආ) දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් විෂයන් 06 කින් සමත්ව තිබීම හා රජයේ දෙපාර්තමේන්තුවක, පළාත් පාලන අයතනයක, සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු අයතනයක සිවිල් ක්ෂේත්‍රයේ පරිපාලක තනතුරක අවුරුදු (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

බඳවා ගනු ලබන ආකාරය : සම්මුඛ පරීක්ෂණයක් මගිනි
වැටුප් පරිමාණය : රු. 51,095 – 7x540;10x640– 60,575 (U- MT 1(III)]මාසික

### 03. තාක්ෂණික නිලධාරී II ශ්‍රේණිය "ආ" ඛණ්ඩය - Technical Officer Grade II Segment "B"

**අවශ්‍ය සුදුසුකම්:**

(අ) දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් ගණිතය සහ විද්‍යා විෂයන් ඇතුළුව විෂයන් (05)ක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 කින් සමත්ව තිබීම.

සහ

(ආ) අ.පො.ස.(උ.පෙළ) විභාගයෙන් විද්‍යා විෂයයන් 03 කින් සමත්ව තිබීම.

සටහන:- බඳවාගනු ලබන්නන් අවුරුදු (03) ක පුහුණුවීමේ කාලසීමාවකට යටත්ව "පුහුණුවන තාක්ෂණික නිලධාරී" වශයෙන් පත් කරනු ලැබේ. පුහුණු කාලය තුළදී විද්‍යාගාර කාර්මික කටයුතු සහ එම කාර්යයන්ට අදාලවන බඩු ඇණවුම් කිරීම, තොග පොත් පවත්වාගෙන යාම සහ ඉංග්‍රීසි භාෂාවෙන් යතුරු ලිවීම පිළිබඳ ප්‍රවීණතාවයක් ලබා ගත යුතු අතර එකී ප්‍රවීණතාවයන් සපුරන සේවකභවතුන් පුහුණුවීමේ කාලසීමා අවසන් වීමෙන් පසුව තනතුරෙහි තහවුරු කර තාක්ෂණික නිලධාරී II ශ්‍රේණිය "ආ" ඛණ්ඩය තනතුරට පත් කරනු ලැබේ.

බඳවා ගනු ලබන ආකාරය : යෝග්‍යතා පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි
වැටුප් පරිමාණය : රු. 51,095 – 7x540; 10 x640– 60,575 (U- MT 1(III)]මාසික

### 04. ක්‍රීඩාගාර සහායක III ශ්‍රේණිය - Gymnasium Attendant Grade III

**අවශ්‍ය සුදුසුකම්:**

i. දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගය සම්මාන සාමාර්ථයන් දෙකක් ද (02) සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබීම සහ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරනු ලබන ක්‍රීඩාගාර සහායක තනතුරට අදාළ ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටමේ 2 හෝ 3 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

ii. දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගය සම්මාන සාමාර්ථයන් දෙකක් ද (02) සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සහිත වසරක (01) සේවා පළපුරුද්දක් තිබීම.

බඳවා ගනු ලබන ආකාරය : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි
වැටුප් පරිමාණය : රු. 44,575 – 16x490– 52,415 (U- PL 2(III)]මාසික

## 05. රියදුරු III ශ්‍රේණිය - Driver Grade III

**අවශ්‍ය සුදුසුකම්:**

i. දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ 02 ක් සහිතව විෂයන් 06 කින් සමත්ව තිබීම.

සහ

ii. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කර ඇති, බර වාහන පැදවීම සඳහා වූ රියදුරු බලපත්‍රයක් තිබීම හා බර වාහන රියදුරු බල පත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර 03ක් රියදුරු තනතුරෙහි පළපුරුද්දක් ලබා තිබීම.

බඳවා ගනු ලබන ආකාරය : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි
වැටුප් පරිමාණය : රු. 48,005 – 16x490– 55,845 (U- PL 3(III)]මාසික

## 06. කම්මල්කරු III ශ්‍රේණිය - Blacksmith Grade III

**අවශ්‍ය සුදුසුකම්:**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන කම්මල්කරු තනතුරට අදාළ ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

බඳවා ගනු ලබන ආකාරය : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි
වැටුප් පරිමාණය : රු. 48,005 – 16x490 – 55,845 (U- PL 3(III)]මාසික

## 07. හෙද නිලධාරී (කොන්ත්‍රාත් පදනම මත) – Nursing Officer (Contract Basis)

**අවශ්‍ය සුදුසුකම්:**

(අ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 03 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම,

සහ

(ආ) හෙදියක වශයෙන් ප්‍රවීණත්වය ලබා ඇති බවට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පිළිගත් හෙද ප්‍රවීණතා සහතිකය තිබීම

බඳවා ගනු ලබන ආකාරය : සම්මුඛ පරීක්ෂණයක් මගිනි
වැටුප් පරිමාණය : රු. 51,095/- + (ජීවන වියදම් දීමනාව)

## 08. වඩු කාර්මික (කොන්ත්‍රාත් පදනම මත) – Carpenter (Contract Basis)

**අවශ්‍ය සුදුසුකම්:**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන වඩුකාර්මික තනතුරට අදාළ ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

බඳවා ගනු ලබන ආකාරය : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි
වැටුප් පරිමාණය : රු. 48,005 /- + (ජීවන වියදම් දීමනාව)

**සටහන:**

**i. ඉහත අංක 01 සිට 06 තෙක් දක්වා ඇති තනතුරු සඳහා මූලික වැටුපට අමතරව, ජීවන වියදම් දීමනාව රු. 17,800/- සහ මූලික වැටුපෙන් ප්‍රතිශතයක් ලෙස මාසික අන්තර් දීමනාව ද ගෙවනු ලැබේ.**

**ii කළමනාකරණසේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025 ට අනුව වැටුප් ගෙවනු ලැබේ.**

**iii. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල, විශ්‍රාම වැටුප් අරමුදල සහ සේවක භාර අරමුදල සඳහා හිමිකම් ලබයි.**

**iv. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය.**

**අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය:** විස්තර සහිත දැන්වීම සහ අයදුම්පත් විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවියට (***http://www.itum.mrt.ac.lk***) පිවිසීමෙන් බාගත හැක. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාල සහතික වල පිටපත් සමඟ 2025.11.14 දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **නියෝජ්‍ය ලේඛකාධිකාරී, තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය, දියගම, හෝමාගම** යන ලිපිනයට එවීමට පියවර ගත යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ අදාල තනතුර සඳහන් කල යුතුය. රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානීන් මඟින් අයදුම්පත් ඉදිරිපත් කල යුතුය. ආයතනික අයදුම්පත් ආකෘතියට අදාල නොවීම, අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි වීම, අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙන යම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කල විට කුමන හේතුවක් නිසා හෝ නැවත සලකා බලනු නොලැබේ.

**අධ්‍යක්ෂ,**
**තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය**
2025.11.01